# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 පෙබරවාරි මස 09 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.40 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සරත් සුමනසේකර
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් අංගගේ
ජගත් කුමාර
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහේෂ් අල්මේදා
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රොයිස් විජිත
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සුනිල් වටගල
සෙනල් වෙල්ගම

## 01. සභාපතිවරයාගේ නිවේදන:

*i*

*"ගරු ඇම්. සුමිත් ලාල් මෙන්ඩිස් මැතිතුමාව 2016.02.08 දින සිට බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"අද දින සිට ඉදිරියට පැවැත්වෙන සභා රැස්වීම් පෙ.ව. 9.30 සිට තේ විවේකයකින් තොරව පවත්වාගෙන යනු ලබන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*" ගරු මන්ත්‍රීවරුන්ගේ වාහන නැවැත්වීම සම්බන්ධව මතු වී ඇති ගැටළු සම්බන්ධයෙන් පොලීසියේ ආරක්ෂාව ලබා ගැනීම පිළිබඳව ගැටළුවක් පවතින බැවින් සභා රැස්වීම් දිනට රියදුරෙකු සමඟ පැමිණීම සුදුසු බවත්, එමගින් සිය වාහනය ආරක්ෂා කර ගැනීමට හැකියාව පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරුණිකව දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2015.12.07 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභාවේත්, 2015.12.08 වන දින පැවති අවදි කාරක සභාවේත්, හා 2016.01.20 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේත් වාර්තා පිළිගන්වන ලදී.

## 03. 2015 අංක ..... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ 2015 අංක .... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය" දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.10 ට පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පත් විය.***

***පූ.භා. 11.14 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***දෙවන වර කියවීමේදී ගරු මන්ත්‍රීවරුන්ගෙන් යොමු වුණු කරුණු කාරණා පිළිබඳ සැලකිල්ලට ගෙන එකී මුදල් (සංශෝධන) ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව යළිත් සළකා බැලීමට, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කළ යුතු යැයි ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාවට සභාව එකඟ වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රඥප්තිය එකී කාරක සභාවට යොමු කරන ලදී.***

***පසුව පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

## 04. **රීති අංක 107 යටතේ යෝජනාව :**

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 05. **පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : පළාත් පාලන මැතිවරණය කඩිනමින් පවත්වන ලෙස ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් හා රජයෙන් ඉල්ලා සිටීම.**

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*“අප රට තුළ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන බොහොමයක් නිල කාලය සම්පූර්ණ වීමෙන් අනතුරුව විසුරුවා හරිනු ලැබ ඇත. තවත් පළාත් පාලන ආයතන කිහිපයක් ජනතා පරමාධිපත්‍යයට පිටුපා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල යටතේ මේ වන විට අවස්ථා දෙකකදී කාලය දීර්ඝ කර ඇත. ජනතාව විසින් පළාත් පාලන ආයතන නියෝජිතයන් පත් කර ගැනීමේදී ඡන්දය ප්‍රකාශ කරනු ලැබුවේ වසර 04 කට කාලයකට පමණි. එසේ වුවද ජනතාවගේ ඡන්ද අයිතිය වළකාලමින් මැතිවරණ නොපවත්වා සිටීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි අතර, ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් පිහිටුවා තිබියදී මෙවැනි තත්ත්වයක් පැවතීම පිළිබඳවද එකඟ විය නොහැක. එසේ හෙයින් කඩිනමින් ජනතාවගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීම ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවේ වගකීම බව විශ්වාස කරන අතර, එම පළාත් පාලන මැතිවරණ කඩිනමින් නියමිත පරිදි පැවැත්වීමට පියවර ගන්නා මෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් හා රජයෙන් ඉල්ලා සිටී.”*

***ප.ව. 01.56 ට නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුව, ගණපූරණය ඇති විය.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. **කල් තැබීම :**

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව ප.ව. 02.34 ට, 2016 පෙබරවාරි මස 23 වන දින පෙ.ව. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.02.09
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.